**මොබිටෙල් සමාගම පාර්භෝගිකයන් ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය දියත් කරයි.**

2008 අගෝස්තු මස 03 වන දින.

ජාතික ජංගම දුරකතන සේවා සැපයුම්කරු වන ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම විසින් එහි සියළුම ග්‍රාහකයින් ලියාපදිංචි කිරීමේ / නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය ප්‍රකාශයට පත් කරන ලදී. විදුලි සංදේශ නියාමන කොමිෂම විසින් නිකුත් කරන ලද නියමයන්ට අනුකූලව සියළුම දුරකතන පාර්භෝගිකයන් සිය දුරකතන ජාලය යටතේ නිවැරදි තොරතුරු සහිතව ලියාපදිංචි වීම අනිවාර්ය වන අතර, පොලීසිය හෝ ආරක්ෂක අංශ වල විමසා සිටි ඕනෑම අවස්ථාවක දී ඔවුන් සතු SIM කාඩ්පත් වල අනන්‍යතාව තහවුරු කිරීමට සමත් විය යුතුය .

මොබිටෙල් සමාගම විසින් ඔවුනට අයත් මධ්‍යස්ථාන 65ක පමණ මෙම ලියාපදිංචි වීමේ හෝ නැවත ලියාපදිංචි වීමේ පහසුකම් සලසා ඇත. මේ සඳහා පාර්භෝගිකයින් විසින් සිය ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය තමා සතු SIM කාඩ් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් සියළුම මොබිටෙල් මධ්‍යස්ථාන වලදී ඕනෑම පාර්භෝගිකයෙකුට නොමිලයේ ඩිජිටල් ඡායාරූපයකට පෙනී සිටීමේ පහසුකම් සලසා ඇති අතර මෙම ස්ථාන පුහුණු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. මෙලෙස ලබා ගත් ඡායාරූප MMS තාක්ෂණය ඔස්සේ මධ්‍යම දත්ත පද්ධතිය වෙත සම්ප්‍රේෂණය කරනු ලබයි . මෙලෙස මධ්‍යස්ථානයක දී ඡායාරූපයකට පෙනී සිටීමට අකමැති පාර්භෝගිකයන් හට තමා විසින්ම ඡායාරූපයක් සැපයීමේ අවස්ථාව සලසා ඇත. මොබිටෙල් සමාගම විසින් සපයා ඇති තවත් සුවිශේෂී පහසුකමක් වනුයේ හැඳුනුම්පත් නොමැති දරුවන් මොබිටෙල් සම්බන්ධතාවයක් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් හෝ එවැනි සම්බන්ධතාවයක් දැනට භාවිතා කරන්නේ නම් එකී සම්බන්ධතාවය භාරකරුවන් විසින් ඔවුනගේ නමට ලියාපදිංචි කිරීමේ පහසුකම් සලසා තිබීමයි. මේ සඳහා භාරකරු දරුවා ද සමඟ මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.

ලියාපදිංචිය / නැවත ලියාපදිංචිය සාර්ථකව නිමවීමෙන් පසු SMS පණිවිඩයක් මගින් ඒ බව දැනුම් දෙනු ලැබේ. ඉන් පසුව පාර්භෝගිකයන් හට සිය ජංගම දුරකතනයෙන් #132# සඳහන් කර ඇමතීමෙන් තමාගේ මොබිටෙල් ඩිජිටල් සහතිකය (MDC) ලබා ගත හැකි අතර එමගින් සිය අනන්‍යතාව තහවුරු කළ හැකිය. මීට අමතරව ලියාපදිංචිය / නැවත ලියාපදිංචිය සාර්ථකව නිම කරන සියළුම පාර්භෝගිකයන් හට තාවකාලික මොබිටෙල් හැඳුනුම් සහතික පතක් (MIC) එම ස්ථානයේදීම නිකුත් කරනු ලබයි . ස්ථිර මොබිටෙල් හැඳුනුම් සහතිකය යථා කාලයේ දී පාර්භෝගිකයාගේ ලියාපදිංචි ලිපිනය වෙත තැපැල්

මාර්ගයෙන් නිකුත් කරනු ඇත. දරුවෙකු වෙත සම්බන්ධතාවයක් ලබා දීමට භාරකරු අදහස් කරන්නේ නම් මොබිටෙල් හැඳුනුම්පත දරුවාගේ නම යටතේ නිකුත් කරන අතර ලියාපදිංචිය භාරකරුගේ නම යටතේ සිදු කරනු ඇත .

ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සභාපතිනිය ලේයිෂා ද සිල්වා චන්ද්‍රසේන මහත්මිය විසින් මෙම ක්‍රියාවලියේ ඇති වැදගත්කම ගැන මෙසේ අදහස් දක්වයි .

“ ජාතික ජංගම දුරකතන සේවා සපයන්නා වශයෙන් අප සමාගම විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද විධානයන්ට 100% ක්ම අනුකූලව කටයුතු කිරීමට තීරණය කරන ලදී. මෙම නිසා අප විසින් මොබිටෙල් ඩිජිටල් හැඳුනුම්පතට අමතරව මුද්‍රිත මොබිටෙල් හැඳුනුම් සහතික පතක් නිකුත් කර සිටීම මගින් පාරිභෝගිකයා වෙත සිය අනන්‍යතාව තහවුරු කිරීම වඩාත් පහසු කර දී ඇත.

තවදුරටත් අදහස් දක්වන ඇය, “මොබිටෙල් පාරිභෝගිකයන් තුළ සමාජ වගකීම තහවුරු කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. මෙම ක්‍රියාවලියේ දී සිදු විය හැකි තාවකාලික දුෂ්කරතා අමතක කරමින් මෙම ජාතික අවශ්‍යතාව ඉටු කර දීමට අප සමඟ ඔවුන් අප සමඟ අත්වැල් බැඳගනු ඇතියි කියා අප විශ්වාස කරනවා.


තාවකාලික මොබිටෙල් හඳුනාගැනීමේ සහතිකය
தற்காலிக மொபிடெல் அடையாள சான்றிதழ்
Temporary Mobitel Identification Certificate

නම
பெயர்
Name ____________________

ජා.හැ.ප./ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර අංකය/தேஅஅ /கடவுச்சீட்டு / சாரதி
அனுமதிப் பத்திர இல. NIC /PP /DL No. □□□□□□□□□□

මොබිටෙල් අංකය
மொபிடெல் இல. 071 □□□□□□□
Mobitel No.

සිම් අංකය
சிம் இல.
SIM No. ____________________

දිනය/ திகதி / Date ____________

මෙම ව්‍යාපෘතිය එළිදක්වන අවස්ථාවේ දී අදහස් දක්වමින් මොබිටෙල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි සුරේන් ජේ. අමරසේකර මහතා " ග්‍රාහකයන් විසින් සපයන ඡායාරූපය, ඔහුගේ / ඇයගේ මුහුණේ ස්වරූපය සමග සැසඳීමේ වගකීම අපගේ අළෙවි නියෝජිතයින් හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන නියෝජිතයන් වෙත පැවරීම ඔවුන් වෙත අමතර පීඩනයක් යෙදවීමක් බව තේරුම් ගත්තා. සියලුම ග්‍රාහයකයින්ගේ ඩිජිටල් ඡායාරූපයක් අපගේ තොරතුරු පද්ධතියට ඇතුල් කර ගැනීම මගින් ඉහත කී දුෂ්කරතාව මගහැර ගත හැකි බවත්, ක්‍රියාපිළිවෙල වඩාත් කාර්‍යක්ෂමව හා පහසු එකක් බවට පත් කළ හැකි බවත් පැහැදිලියි. ඕනෑම ග්‍රාහකයෙක්ට නොමිලයේ ඩිජිටල් ඡායාරූපයක් අපගේ අළෙවි මධ්‍යස්ථානයක දී ලබා ගැනීමේ පහසුකම ලබා දී ඇත . මෙලෙස ග්‍රාහකයාගේ ඩිජිටල් ඡායාරූපයන් අපගේ සුපිරි 3.5G HSPA ජාලය ඔස්සේ මධ්‍යම තොරතුරු පද්ධතිය වෙත යොමු කරනු ලැබේ.මෙසේ සිදු කිරීමෙන් කඩදසි හා ඡායාරූප සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍ය නාස්තිය අවම කර පරිසර හිතකාමී ලෙස හා මනා කාර්‍යක්ෂමතාවයකින් යුතුය කටයුතු කිරීමට හැකි වේ .

තවදුරටත් අදහස් දක්වමින්, "අපගේ මෙම ව්‍යාපෘතියේ අභිප්‍රාය වන්නේ සියලුම කරුණු සැලකිල්ලට ගනිමින් පරිපූර්ණ වු විසඳුමක් ලබා දීමත් හා එය දීපව්‍යාප්තව දියත් කිරීමත් ය. මෙහි එක් පියවරක් වශයෙන් අපගේ සියළු අළෙවි නියෝජිතයින්ට හා අනෙකුත් පාරිභෝගික සේවා සපයන නිලධාරින් හට සම්පූර්ණ උපදෙස් මාලාවක් සපයනු ඇත".

ඔබගේ මොබිටෙල් සම්බන්ධතාව ලියාපදිංචිය / නැවත ලියාපදිංචිය සම්පූර්ණයෙන්ම නොමිලයේ සිදු කරනු ලබයි. ඔබ විසින් කල යුත්තේ ,

- අපගේ ඕනෑම මොබිටෙල් මධ්‍යස්ථානයකට පුද්ගලිකවම පැමිණීම.
- ඔබගේ ජාතික හැඳුනුම්පත / වලංගු විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම
- අපගේ මධ්‍යස්ථානයේ දී ඡායාරූපයකට පෙනී සිටීම හෝ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් සැපයීම.
- ඔබගේ මොබිටෙල් සිම් පත / සිම් පත් ඉදිරිපත් කිරීම.
- බාලවයස්කරුවකු නම් භාරකරු සමග පැමිණීම.

**ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම**

ජාතික ජංගම සේවා සැපයුම්කරු වන ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම පූර්ණ අනුබද්ධිත සමාගමකි. 2004 ජනවාරි මාසයේ දී පූර්ණ පහසුකම් සහිත 2.5 GSM ජාලය ස්ථාපිත කළ අතර, එමගින් EDGE/GPRS සේවා පහසුකම් ලබා දිය හැකි විය. 2007 දෙසැම්බර් මාසයේ දී මොබිටෙල් සමාගම විසින් දකුණු ආසියාවේ ප්‍රථම හා එකම සුපිරි 3.5G HSPA ජාලය හඳුන්වා දෙන ලදි. මේ වන විට 3.5G සහ 2.5G ජාල සහ සේවා වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 275කට අධික මුදලක් සමාගම විසින් ආයෝජනය කර ඇති අතර, මේ වසර අවසානය වන විට ස්ථාපිත කර ඇති 1000කට අධික මූලික සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන ප්‍රමාණය 1500ක් දක්වා වර්ධනය කිරීමට බලාපොරොත්තු වෙයි .